කුරුණෑගල ප්‍රාදේශීය සභා

අභ්‍යන්තර ප්‍රතිපත්ති

දැක්ම

"අපිට හිතැති, අප හිත ඇති ආදරණීය පුරවරයක්"

මෙහෙවර

ප්‍රාදේශිය සභා පනතේ ප්‍රතිපාදනයන්ට

අනුකූලව බල ප්‍රදේශය තුල ජනතාවගේ

භෞතික හා මානව සම්පත්

සංවර්ධනයට උදෙසා

සියළු සම්පත් ඒකරාශි කොට

පොදු පහසුකම් වර්ධනය තුළින්

ජනතා සහභාගීත්වයෙන් යුත්

කාර්යක්ෂම, තීරසාර හා සැළසුම්ගත

සංවර්ධන ක්‍රියාවලියක් මගින් ප්‍රදේශයේ

ජන දිවිය නගා සිටුවීම

කුරුණෑගල ප්‍රාදේශිය සභාවේ

මෙහෙවර වන්නේය.

පෙරවදන

කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවාලීම උදෙසා කුරුණෑගල ප්‍රාදේශීය සභාව විසින් නොයෙකුත් ප්‍රජා සේවාවන් ක්‍රියාත්මක කර ඇත.

මේ සඳහා ප්‍රජා සහභාගීත්වය, ව්‍යාපාරික ප්‍රජාව හා සභාවේ කාර්යය මණ්ඩලය ලබා ගෙන ඇති අත්දැකීම්ද උපයෝගී කර ගනිමින් මෙම ප්‍රතිපත්ති ප්‍රකාශ සකස් කර ඇති අතර, ඒ සඳහා සේවාවන්ට අදාල සියළුම පාර්ශවකරුවන්, රජයේ ආයතන වල සහයෝගය ද ලබා ගෙන ඇති අතර, මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කර ගැනීම සඳහා වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ හා කුරුණෑගල ප්‍රාදේශීය සභාව භාර පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීගේ ද නොමද සහයෝගය හා උදව් උපකාර නිරතුරුව ලබා ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත් වන ප්‍රජාවගේ සේවාවන් ඉටු කිරීමේදී නීතිමය රාමුව තුල කටයුතු කරමින් සියළුම ප්‍රජාව වෙත ප්‍රශස්ත මහජන සේවාවක් ලබාදීමේ අරමුණින් සකස් කරන ලද මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කරගැනීම සඳහා සහය දුන් වයඹ පළාත් පාලන කොමසාරිස්, නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්, සහකාර පළාත් පාලන කොමසාරිස්, ජේෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරී සහ විමර්ශන නිලධාරී ඇතුළු කාර්යය මණ්ඩලයේ සියළු දෙනාටත් සහය ලබා දුන් අනෙකුත් ආයතන වල ප්‍රධානීන්ටත් මෙයින් කෘතඥතාවය පුදකර සිටිමි.

ලේකම්

ජේ. ඒ. අජිත් කුමාරසිංහ

කුරුණෑගල ප්‍රාදේශීය සභාව

පටුන

	පිටු අංක
1. වරප්‍රසාද නොලත් කණ්ඩායම් සඳහා සේවාවන් සැපයීමේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය	5 - 7
2. පළාත් පාලන ආයතනය ගිණුම් හා වාර්තාකරණ සම්බන්ධ අභ්‍යන්තර ප්‍රතිපත්තිය	8 - 10
3. කාර්ය මණ්ඩලය, සනිපාරක්ෂක කම්කරුවන්/ මාර්ග කම්කරුවන් ඇතුළු කාර්ය මණ්ඩලය සඳහා සුභ සාධක සහන සැලැසීම සඳහා වූ අභ්‍යන්තර ප්‍රතිපත්තිය	11 -13
4. අවධානම් සහිත කණ්ඩායම් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර සඳහා විශේෂයෙන් සලකා බැලීමේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය	14 - 15
5. පොළහුම් සහ වෙළඳපල අවකාශ ලබාදීමේ ප්‍රමුඛතාවයන් සලකා බැලීමේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය	16 - 17
6. ආර්ථික වශයෙන් වරප්‍රසාද නොලත් කණ්ඩායම් සඳහා ආදාහනාගාර/ සුසානභූමි/ මිහිදන්භූමි වෙන් කිරීමට හා ගාස්තු අය කිරීමට අදාල අභ්‍යන්තර ප්‍රතිපත්තිය	18 - 19
7. ක්ෂුද්‍ර කර්මාන්ත හා අවිධිමත් කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ නියාමනයට අදාල අභ්‍යන්තර ප්‍රතිපත්තිය	20 - 21
8. අවිධිමත් ජනාවාස නියාමනය කිරීම සඳහා අභ්‍යන්තර ප්‍රතිපත්තිය	22 - 23
9. අවිධිමත් ව්‍යාපාර නියාමනයට අදාල අභ්‍යන්තර ප්‍රතිපත්තිය	24 - 25
10. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය	26 - 27
11. ජල හා සනීපාරක්ෂාව පිලිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය	28 - 30
12. වැඩ, භාණ්ඩ හා සේවා සැපයීම සඳහා වූ අභ්‍යන්තර ප්‍රතිපත්තිය	31

කුරුණෑගල ප්‍රාදේශිය සභාව

අභ්‍යන්තර ප්‍රතිපත්ති අංක 01

<u>වරප්‍රසාද නොලත් කණ්ඩායම් සඳහා සේවාවන් සැපයීමේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය</u>

01. හැඳින්වීම

කුරුණෑගල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය ඇතුලත මහජන සෞඛ්‍යයට, පොදු උපයෝගීතා සේවාවන්ට සහ පොදු මංමාවත් වලටද, සාමාන්‍යයෙන් එම ප්‍රදේශය ඇතුලත ජනතාවගේ සුඛවිහරණය, පහසුව, සුභසාධනය සහ සියළු පහසුකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමටද අදාල සියළු කරුණු විධිමත් කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ කුරුණෑගල ප්‍රාදේශිය සභාවට භාරවී ඇත.

ඒ අනුව අප සභා බල ප්‍රදේශයේ ජීවත් වනු ලබන වරප්‍රසාද නොලත් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම පිණිස අප ප්‍රාදේශිය සභාවේ නීතිමය රාමුව තුල සැපයිය යුතු සේවාවන් සහ පහසුකම් වඩාත් ප්‍රසස්ථ මට්ටමෙන් කාර්යක්ෂමව සහ ඵලදායීව මෙම කණ්ඩායම් වෙත ලබා දීම මෙම ප්‍රතිපත්තියේ අරමුණ වේ.

මෙම ප්‍රතිපත්තිය මගින් පහත සඳහන් කණ්ඩායම් ආවරණය කිරීමට කටයුතු කරනු ලබයි.

- ජේෂ්ඨ පුරවැසියන්
- ආබාධිත පුරවැසියන්
- අවතැන්වුවන්
- අවිධිමත් පදිංචිකරුවන්
- අවිධිමත් ව්‍යාපාර

02. වරප්‍රසාද නොලත් කණ්ඩායම් සඳහා සේවාවන් සැපයීමේ නීතිමය විධිවිධාන

2.1 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය</u>

බල ප්‍රදේශයේ සියළුම ජනතාවගේ සුඛවිහරණය, පහසුව, සුභසාධනය සහ සියළු පහසුකම් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම.

2.2 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 (XXIII) වන වගන්තිය</u>

දුගී ජනයාට සහනාධාර සැලසීම සඳහාත්, අසරණ තැනැත්තන් සහ කායිකව, මානසිකව හෝ සමාජීය වශයෙන් ආබාධිත තැනැත්තන් පුනුරුත්ථාපනය කිරීම සඳහාත්, ප්‍රාදේශීය සභා අරමුදලින් යම් කොටසක් වියදම් කිරීම.

2.3 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132 (අ, ඒ, ඔ) වන වගන්ති</u>

පොදු සේවා ඉටු කිරීමේදී ප්‍රාදේශීය සභා අරමුදලින් වියදම් දැරීමට අනුමැතිය ලබා දීම.

2.4 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149,150,151,152 වන වගන්ති

බල ප්‍රදේශයේ පවත්වාගන යනු ලබන ව්‍යාපාර විධිමත් කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අය කිරීම.

03. පිළිපැදිය යුතු සීමා හා කොන්දේසි

- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතට අනුකූලව කටයුතු කිරීම.
- ප්‍රාදේශීය සභාව විසින් වැළදගෙන ඇති සහ අනුමත කොට ඇති අතුරු ව්‍යවස්ථා වලට අනුකූලව කටයුතු කිරීම.
- ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති වලට අනුකූලව කටයුතු කිරීම.

04. අදාල කාර්යය හා කර්තව්‍ය සදහා සම්බන්ධ වන පාර්ශවකරුවන්

- ප්‍රාදේශීය සභාව
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය
- පළාත් පාලන දෙපාර්තමේන්තුව
- බල ප්‍රාදේශයේ වරප්‍රසාද නොලත් කණ්ඩායම්

05. ප්‍රතිපත්තිය

5.1 ජේෂ්ඨ පුරවැසියන්

I. තම ගතේ ශක්තිය තමා ලැබූ බුද්ධිය මහා දැණුම් සමුදුර ,දේශයට කැප කල ජේෂ්ඨ පුරවැසියන්ට සේවාවන් ලබා ගැනීම සදහා පැමිණීමේදී ඔවුන් සුහදශීලිව පිලිගෙන ඔවුන්ගේ අවශ්‍යතාවයන් හදුනාගෙන ප්‍රමුඛතාවය දී කටයුතු කරන ලෙසට සභාවේ නිලධාරින් හා සේවකයින් පත්කර තිබීම.

II. එම පත්කල නිලධාරින්, සේවකයින් ඔවුන්ගේ රාජකාරිය හොඳින් ඉටු කරන බවට වගබලා ගැනීම සදහා අධික්ෂණ නිළධාරියෙකු විසින් නිරන්තර සෝදිසි කිරීම් සිදු කිරීම.

III. ජේෂ්ඨ පුරවැසියන්ගේ අව්‍යතා ඉටු වන තෙක් රැදීසිටීම සදහා වෙන්කරන ලද ආසන පනවා තිබීම.

IV. ජේෂ්ඨ පුරවැසියන්ගේ සේවාවන් කඩිනමින් ඉටු කර දීමට කටයුතු කරන ලෙසට පුස්තකාල හා උපකාර්යාල වල සේවය කරන හා ප්‍රධාන කාර්යාලයේ සේවය කරන නිලධාරීන්ට ලිඛිත උපදෙස් වරින්වර නිකුත්කර ඒ අනුව කටයුතු වන්නේදැයි නිරන්තර අධීක්ෂණය.

5.2 <u>ආබාධිත පුරවැසියන්</u>

I. ආබාධිත පුරවැසියන් සඳහා වෙන් කරන ලද වැසිකිලි/ කැසිකිලි පහසුකම් සපයා තිබීම.
II. ආබාධිත පුරවැසියන් සඳහා සුදුසු ප්‍රවේශ මාර්ග කාර්යාල පරිශ්‍රයේ, උප කාර්යාල හා පුස්තකාලවල ස්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම.
III. ශ්‍රව්‍ය දෘශ්‍ය ආබාධිත සේවාලාභීන්ගේ සේවාවන් ඉටු කිරීම සඳහා පුරුදු පුහුණු කරන ලද සේවකයෙකු සභාවේ හා පුස්තකාලවල රාජකාරි කටයුතු සඳහා යොදවා තිබීම.

5.3 <u>අවතැන්වුවන් හා අවිධිමත් පදිංචිකරුවන්</u>

I. නායයාමට ලක්විය හැකියැයි බලප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇති වල්පොලකන්ද, ඉඳුල්ගොඩකන්ද යන ප්‍රදේශවල හඳුනාගත් නිවාස වල ජනතාව වෙනත් සුදුසු ස්ථානවල අවස්ථානුකූලව පදිංචිකරවීමට පියවර ගැනීම.
II. නිරන්තරයෙන් ජල ගැලීම්වලට ලක්වන මාස්පොත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ අළුපොතගම හා විල්ගම්දෙමටව ග්‍රාම නිලධාරි වසම්වල ජල ගැලීම්වලට ලක්වන ජනතාව වෙනුවෙන් අවස්ථානෝචිත පරිදි උදව් අපකාර කිරීම.
III. සුළු ජලගැලීම්වලට ලක්වන බල ප්‍රදේශයේ ජනතාව වෙත මූලික පහසුකම් සැලැසීමේ වැඩ පිලිවෙලක් සකස් කර තිබීම.

5.5 <u>අවිධිමත් ව්‍යාපාර</u>

I. බල ප්‍රදේශයේ මාර්ග රක්ෂිතයෙහි අවිධිමත්ව රැදි සිටින ව්‍යාපාරිකයින්ට සංචාරක වෙළඳාම සඳහා බලපත්‍රයක් හා හැඳුණුම්පතක් විධිමත්ව නිකුත් කිරීම.
II. මාර්ග රක්ෂිතයෙහි රැදි සිටින අවිධිමත් ව්‍යාපාරිකයින් ප්‍රාදේශිය සභාව සතු භූමිවල කඩ කාමර ඉදිකිරීමෙන් පසුව විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ බදු පදනම මත ස්ථානගත කර ව්‍යාපාරය විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

අභ්‍යන්තර ප්‍රතිපත්ති අංක **02**

පළාත් පාලන ආයතනය ගිණුම් හා වාර්තාකරණ සම්බන්ධ අභ්‍යන්තර ප්‍රතිපත්තිය

01. හැදින්වීම

බල ප්‍රදේශයේ පොදු මහජනතාවට බදු පනවා ඔවුන්ගේ බදු අරමුදල් වලින් බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු ඉටු කිරීම පළාත් පාලන ආයතනයක ප්‍රමුඛ වගකීම වන අතර එම බදු මුදල් බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා යෙදීමේදී ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කර ඇත්ද යන්න මැන බැලීමේ ප්‍රධන අංගය වන්නේ ආයතනයේ නිවැරදි ගිණුම් හා වාර්තාකරණයයි.

ඒ අනුව පහත සඳහන් කරුණු වලට ප්‍රමුඛතාව දී ගිණුම්කරණය හා වාර්තාකරණය නිවැරදිව ඉටු කර ගැනීමට මෙම අභ්‍යන්තර ප්‍රතිපත්තිය මගින් බලාපොරොත්තු වේ.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් වූ ගිණුම් හා වාර්තාකරණය
- දුප්පත්කමට සංවේදී ගිණුම් වාර්තාකරණය
- තිරසර සංවර්ධන ඉලක්ක හා සබැඳුණු ගිණුම් හා වාර්තාකරණය
- දේශගුනික විපර්යාසයන්ට ඔරොත්තුදීම හා සබැඳුණු ගිණුම් හා වාර්තාකරණය

02. ගිණුම් හා වාර්තාකරණය සම්බන්ධ නීතිමය විධිවිධාන

2.1 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 167, 168, 169 වන වගන්තිය

ඉදිරි වර්ෂය සඳහා ලබා ගත හැකි ආදායම හා යෝජිත වියදම ඇතුලත් අයවැය ලේඛනයක් පිළියෙල කිරීම හා එයට සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.

2.2 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 170 වන වගන්තිය

අනුමත කරන ලද අයවැයෙහි මුළු වියදම් ප්‍රමාණය නොඉක්මන පරිදි වැය ශීර්ෂ මාරු කිරීමට කටයුතු කිරීම.

2.3 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 171 වන වගන්තිය

ප්‍රාදේශීය සභා අරමුදල සහ ප්‍රාදේශීය සභාව භාවිතා කරනු ලබන දේපල නියමිත ආකෘති හා ක්‍රමවේද යටතේ නියමිත දිනයන් හි ගිණුම් තැබීම හා ඒවා බල ප්‍රදේශයේ ජනතාව අතර දැනගැනීමට කටයුතු කිරීම.

2.4 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 172 වන වගන්තිය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අදාලව සභාවේ ගිණුම්කරණ කටයුතු විගණනයට යටත් බව.

2.5 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති අනුව කටයුතු කිරීම.

2.6 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව කටයුතු කිරීම.

03. පිළිපැදිය යුතු සීමා හා කොන්දේසි

- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතට අනුකූලව කටයුතු කිරීම.
- ප්‍රාදේශීය සභාව විසින් වැළදගෙන ඇති සහ අනුමත කොට ඇති අතුරු ව්‍යවස්ථා වලට අනුකූලව කටයුතු කිරීම.
- ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති වලට අනුකූලව කටයුතු කිරීම.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව කටයුතු කිරීම.

04. අදාල කාර්යය හා කර්තව්‍ය සඳහා සම්බන්ධ වන පාර්ශවකරුවන්

- ප්‍රාදේශීය සභාව
- පළාත් පාලන දෙපාර්තමේන්තුව
- විගණන දෙපාර්තමේන්තුව
- බල ප්‍රාදේශයේ ජනතාව

05. ප්‍රතිපත්තිය

5.1 <u>ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් වූ ගිණුම්කරණය</u>

I. බල ප්‍රදේශයේ කාන්තා මූලික පවුල් නගා සිටුවීම සඳහා ස්වයං රැකියා පුහුණු ව්‍යාපෘති සඳහා මුදල් වෙන්කර දීම.
II. ගැටුම් නිරාකරණය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් උපදේශන අවශ්‍ය පවුල් හඳුනා ගෙන ඔවුන් දේශන හා වැඩමුළු සඳහා යොමු කිරීම.
III. කාන්තා සුභසාධනය කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබීම.
IV. මාතෘ හා ළමා පෝෂණ වැඩ සටහන් සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබීම.
V. බල ප්‍රදේශයේ ව්‍යවසායකයන් සඳහා සභාවට අයත් සතිපොළ අයකිරීමකින් තොරව වෙළදාම හා ප්‍රචාරණය සඳහා අවස්ථාව සලසා දී තිබීම.

5.2 <u>දුප්පත්කමට සංවේදී ගිණුම්කරණය</u>

I. බල ප්‍රදේශයේ දුරිද්‍රතාවයෙන් පෙලෙන පවුල් සඳහා වැසිකිලි ඉදිකර ගැනීම සඳහා ආධාර උපකාර කිරීම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් තොරතුරු කැඳවා පවුල් තෝරා ගැනීම විනිවිද කිරීම.
II. අඩු ආදායම්ලාභී දරුවන් සඳහා පාසැල් උපකරණ හා පොත්පත් ලබාදීම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් තොරතුරු කැඳවා අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් තෝරා ගැනීම.
III. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් අඩු ආදායම්ලාභීන් සම්බන්ධ තොරතුරු කැඳවා පවුල් තෝරා ගෙන කාබනික ගෙවතු වගා නගා සිටුවීම හා ආධාර උපකාර සිදු කිරීම.
IV. දුගී දුප්පත් පවුල් ග්‍රාම සේවා නිළධාරී මගින් තොරතුරු කැඳවා ඒ අනුව නිවාස ඉදිකරගැනීම සඳහා මුල්‍ය ආධාර කිරීම හා ද්‍රව්‍ය ආධාර ලබාදීම.
V. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විනිවිදව තෝරා ගන්නා පවුල් වලට කසල බඳුන් නොමිලේ ලබාදීම.
VI. දුගී දුප්පත් පවුල්වල මෘත දේහ දුගීබව සනාථකර ගැනීමෙන් පසුව සභාවේ ආදාහනාගාරවල නොමිලේ ආදාහනය කිරීම.

VII. පාසැල් නොයන දරුවන් හඳුනාගෙන ඔවුන් පාසැල්ගත කිරීම.

VIII. දිලිඳු පවුල් හඳුනාගෙන ඔවුන් සඳහා බීජ ලබාදීම.

IX. මහා පරිමාන ව්‍යවසායකයින්ගේ උදව් උපකාර ඇතුව සුළු පරිමාණ ව්‍යවසායකයින් සඳහා උදව් උපකාර ලබාදීම හා ඔවුන් නගා සිටුවීමට කටයුතු කිරීම.

X. ආබාධ සහිත පුද්ගලයන් හා රෝගී පුද්ගලයන් සඳහා ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශ අනුව ආධාර උපකාර සිදු කිරීම.

XI. විවිධ හැකියාවන් හා දක්ෂතා ඇති දරුවන් සඳහා ප්‍රාදේශිය ලේකම්තුමන්ගේ නිර්දේශ මත අවශ්‍ය උපකරණ හා මුල්‍ය ආධාර ලබාදීම.

5.3 <u>තිරසර සංවර්ධන ඉලක්ක හා සබැඳුණු ගිණුම්කරණය</u>

I. ලැබෙන මහජන ඉල්ලීම් අනුව පොදු ළිං හා නාන තොටුපල නොමිලේ නඩත්තුව හා අළුත්වැඩියාව සිදු කරදීම.

II. බල ප්‍රදේශයේ ජනතාවගෙන් ලබා ගන්නා යෝජනා අනුව සංවර්ධන කටයුතු හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

III. පරිසර සංරක්ෂණ වැඩ සටහන් බල ප්‍රදේශයේ අවශ්‍යතාවය අනුව ක්‍රියාත්මක කිරීම

IV. හඳුනාගන්නා ප්‍රදේශවල රුක් රෝපන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

V. බල ප්‍රදේශයේ පවතින සති පොළ හා පොදු වෙළඳපල අළුත්වැඩියාව හා නඩත්තුව

VI. නිරෝගී ජනතාවක් බිහි කිරීමේ අරමුණින් විවිධ රෝග නිවාරන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

VII. බල ප්‍රදේශයේ කසල වර්ගීකරණය හා ප්‍රතිචක්‍රීයකරණ සිදු කිරීම.

VIII. ජල ව්‍යාපෘති සඳහා සභාවේ මුල්‍ය දායකත්වය සැපැයීම.

5.4 <u>දේශගුනික විපර්යාසයන්ට ඔරොත්තුදීම හා සබැඳුණු ගිණුම්කරණය</u>

I. හදිසි ආපදා තත්වයන් සඳහා අයවැය තුල ප්‍රතිපාදන වෙන්කර තිබීම.

II. ආපදා තත්වයන්ට ලක්වන ජනතාව සඳහා තාවකාලික රැඳවුම් මධ්‍යස්ථාන හඳුනාගෙන තිබීම.

III. අවිධිමත් ජනාවාස ලෙස හට ගන්නා පිරිස් ඒකරාශී කිරීම සඳහා කුරුණෑගල ප්‍රාදේශිය සභාව මගින් බල ප්‍රදේශය තුල කෝපිකන්දවත්ත නමින් ගම්මානයක් වෙන්කර තිබීම.

IV. ආපදාවට ලක්වන මාර්ග හා ස්ථාන නඩත්තුව හෝ අළුත්වැඩියාව සඳහා අයවැය තුල ප්‍රතිපාදන වෙන්කර තිබීම.

V. ප්‍රාදේශිය සභාව තුල ආපදා කළමනාකරණ ඒකකයක් ස්ථාපනය කර තිබීම.

අභ්‍යන්තර ප්‍රතිපත්ති අංක **03**

<u>කාර්ය මණ්ඩලය, සනිපාරක්ෂක කම්කරුවන්/ මාර්ග කම්කරුවන් ඇතුළු කාර්ය මණ්ඩලය සඳහා සුභ සාධක සහන සැලැසීම සඳහා වූ අභ්‍යන්තර ප්‍රතිපත්තිය</u>

01. හැදින්වීම

කුරුණෑගල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය ඇතුලත මහජන සෞඛ්‍යයට, පොදු උපයෝගීතා සේවාවන්ට සහ පොදු මංමාවත් වලටද, සාමාන්‍යයෙන් එම ප්‍රදේශය ඇතුලත ජනතාවගේ සුඛ විහරණය, පහසුව, සුභසාධනය සහ සියළු පහසුකම් ආරක්ෂා කිරිමට සහ ප්‍රවර්ධනය කිරිමටද අදාල සියළු කරුණු විධිමත් කිරිම, පාලනය කිරිම සහ පරිපාලනය කිරිම 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ කුරුණෑගල ප්‍රාදේශිය සභාවට පැවරී ඇති අතර එම කාර්යයන් ඉටු කිරීමේදී සභාවේ කාර්යය මණ්ඩලය විශාල කාර්යය භාරයක් ඉටු කරනු ලබයි. ඔවුන්ගේ සුඛවිහරණය හා සුඛසාධනය නැංවීම තුලින් සභාවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කර ගැනීම මෙමගින් බලාපොරොත්තු වේ.

02. කාර්ය මණ්ඩලය, සනිපාරක්ෂක කම්කරුවන්/මාර්ග කම්කරුවන් ඇතුළු කාර්ය මණ්ඩලය සඳහා සුභ සාධක සහන සැලැසීම සම්බන්ධ නීතිමය විධිවිධාන

2.1 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 (I/II/III/IV/V/VI) වන වගන්තිය</u>

ප්‍රාදේශීය සභා සේවකයන්ගේ තනතුරු ඇති කිරීම, වැටුප් නියම කිරීම, විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ගෙවීම.

2.2 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 (XXVIII) වන වගන්තිය</u>

ප්‍රාදේශීය සභා සුභ සාධක සංගම් වලට ප්‍රාදේශීය සභා අරමුදලෙන් මුදල් වෙන් කිරීම.

2.3 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 76 වන වගන්තිය</u>

ප්‍රාදේශීය සභා මාර්ග වල රාජකාරී වල යෙදී සිටින නිලධාරීන් අදාල තනතුරේ කාර්යය ඉටු කිරීමේදී සිදුකරනු ලබන යම් ක්‍රියාවලියක් සම්බන්ධව නඩු පැවරීමකට හෝ දඩයකට යටත් නොවන බව.

2.4 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132(එ,ඒ,ඕ) වන වගන්ති</u>

සේවකයින්ගේ සුඛසාධන කටයුතු, රෝගාතුර වූ විට හෝ ණයගැති වූ විට හෝ ආපදාවකට මුහුණ දුන් විට සහන සැලසීම.

2.5 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132(ග) වන වගන්තිය</u>

සභාව වෙනුවෙන් කටයුතු කිරීමේදී සේවකයන්ගේ හා නිලධාරීන්ගේ ගමන් වියදම් පියවීමට ප්‍රාදේශීය සභා අරමුදල් යෙදවිය හැකි බව.

2.6 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132(ජ) වන වගන්තිය

ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී යම් නිලධාරියෙකු විසින් වියදම් කල වියදම් පියවීමට ප්‍රාදේශීය සභා අරමුදල් යෙදවිය හැකි බව.

03. පිළිපැදිය යුතු සීමා හා කොන්දේසි

- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතට අනුකූලව කටයුතු කිරීම.
- ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති වලට අනුකූලව කටයුතු කිරීම.
- පළාත් පාලන දෙපාර්තමේන්තුව හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ.

04. අදාල කාර්යය හා කර්තව්‍ය සඳහා සම්බන්ධ වන පාර්ශවකරුවන්

- ගරු සභාපතිතුමා ප්‍රමුඛ ගරු මන්ත්‍රී මණ්ඩලය
- පළාත් පාලන දෙපාර්තමේන්තුව
- ප්‍රාදේශීය සභා ලේකම් ප්‍රමුඛ කාර්යය මණ්ඩලය

05. ප්‍රතිපත්තිය

I. මේ සඳහා කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ සනිපාරක්ෂක කම්කරුවන්/මාර්ග කම්කරුවන් ඇතුළු කනිෂ්ඨ කාර්ය මණ්ඩලය හා කාර්ය මණ්ඩලයේ සියළු දෙනාම ඇතුලත් වේ.

II. සභාවේ ස්ථිර පදනම මත හා අනියම් ආදේශක සේවා ගිවිසුම් පදනම මත සේවය කරන සියළුම අයවළුන්ටද මෙම ප්‍රතිපත්තිය අදාල වේ.

III. නිලධාරියෙකු/සේවකයෙකු යම් කිසි රෝගාබාධයක් හෝ අනතුරක් නිසා ඉපැයීමේ ශක්තිය හීන වුවහොත් හා එක්තැන් වුවවහොත් කඩයිම් මගින් යොමු කරනු ලබන ඉල්ලීමක් මත වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශ හා විෂයභාර අමාත්‍යවරයාගේ හා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය පරිදි තීරණය කරන මුදලක් ලබාදීමට අවශ්‍ය පියවර කඩිනමින් ඉටු කිරීම. (මේ සඳහා පවුලේ මව පියා හා තම දරුවන් දැඩි සේ රෝගාතුර වූ අවස්ථාවන්ද ඇතුලත්ය.)

IV. යම්කිසි සභා සේවකයෙකුගේ පවුලේ අවමංගල කටයුක්තත් සිදු වුවවහොත් අවශ්‍යතාවය මත හට්,පුටු, හා විදුලි ආලෝකය ලබාදීම.

V. යම්කිසි සභා සේවකයෙකු මිය ගියහොත් සේවකයින්ගේ හා සුභ සාධක සංගමයේ මැදිහත්වීම හා ආධාර උපකාර මත මලගෙදරට, හත් දින දානමය පුන්‍ය කර්මයට හා පවතින ආර්ථික තත්වය මත දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා උදව් උපකාර කිරීම

VI. සභාවේ කාර්ය මණ්ඩලය මැදිහත්වීම මත ආර්ථික තත්ත්වයන්ද සැලැකිල්ලට ගෙන අධ්‍යාපන කටයුතු සඳහා අමතර උපකාරක පන්ති අවශ්‍ය වන්නේනම් ඒ සඳහා මැදිහත්වි ගුරුවරුන් සමග සාකච්ජා කර නොමිලේ උපකාරක පන්ති සඳහා සහභාගී විමට අවස්ථාව සලසා දීම.

VII. අගතියට පත්වන්නේ අඩු ආදායම්ලාභී සභාවේ සේවකයෙකු නම්, සභාව මගින් ලබාදෙන ආධාර උපකාර වලදී දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා පාසැල් උපකරණ ලබාදීමේදි හා වැසිකිලි ආධාර ලබාදිමේදිද ගැබිනි මව්වරුන් සඳහා පෝෂණ මල්ලක් ලබාදීම වැනි වැඩ සටහන් වලදි ප්‍රමුඛතාවයක් දී කටයුතු කිරීම.

VIII. අගතියට පත් සභා සේවකයින්ගේ දරුවන් සඳහා සභාවේ පෙර පාසැල්වල නොමිලේ අධ්‍යාපන කටයුතුවල නිරතවීම සඳහා අවස්ථාව සලසාදීම.

IX. ඉදිරියේදි ආර්ථික වශයෙන් ශක්තිමත්වීම සඳහා වෙනමම අරමුලක් පිහිටුවාගෙන ඒ සඳහා අරමුදල් රැස්කර ගැනීම සඳහා සුදුසු පරිදි සංවිධානය වීම.

අභ්‍යන්තර ප්‍රතිපත්ති අංක **04**

අවධානම් සහිත කණ්ඩායම් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර සඳහා විශේෂයෙන් සලකා බැලීමේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය

01. හැඳින්වීම

කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විධිමත් පරිදි ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හැකියාව නොමැති ඌන ප්‍රාග්ධනයක් සහිත වූ විශාල ජන කොට්ඨාෂයකින් මෙන්ම කාන්තා ගෘහ මූලික පවුල් සංඛ්‍යාවකින් ද විශේෂ අවශ්‍යතා සහිත ජීවත් වීම සඳහා නිසි ආදායම් මාර්ගයක් නොමැති ජන කොට්ඨාෂයකින් ද රජයේ ආධාර මත ජීවත් වන ගෘහ ඒකක විශාල සංඛ්‍යාවකින් ද සමන්විත වේ.

මින් විශාල පිරිසකට දෛනිකව ජීවත් වීම පිණිස නිසි ආදායම් මාර්ගක් නොමැති අතරම ව්‍යාපාරික ආයතනයක් පවත්වාගෙන යාමට නිසි ව්‍යාපාරික භූමි ප්‍රමානයක් ද නොමැති අතර ඔවුන් තම ව්‍යාපාරික ස්ථාන පවත්වාගන යාම සඳහා නාගරිකරණයකට ලක්ව ඇති ප්‍රදේශ ආශ්‍රිත ප්‍රධාන මාර්ග හා රක්ෂිත භාවිතා කරනු ලබන අතර එවැනි භාවිතයන් තුල සිටින ජනතාව සඳහා කටයුතු කිරීම මෙම මෙමගින් බලාපොරොත්තු වේ.

02. අවධානම් සහිත කණ්ඩායම් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර සම්බන්ධ නීතිමය විධිවිධාන

2.1 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19(XXIII) වන වගන්තිය

දුගී ජනයාට සහනාධාර සැලසීම සඳහාත්, අසරණ තැනැත්තන් සහ කායිකව, මානසිකව හෝ සමාජීය වශයෙන් ආබාධිත තැනැත්තන් පුනුරුත්ථාපනය කිරීම සඳහාත්, ප්‍රාදේශීය සභා අරමුදලින් යම් කොටසක් වියදම් කිරීම.

2.2 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126(X) වන වගන්තිය

සංචාරක වෙළඳාම පාලනය හා විධිමත් කිරීමට අතුරු ව්‍යවස්ථා සැපයීමේ බලය.

2.3 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149,150,151,152 වන වගන්තිය

බල ප්‍රදේශයේ පවත්වාගන යනු ලබන ව්‍යාපාර විධිමත් කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අය කිරීම.

03. පිළිපැදිය යුතු සීමා හා කොන්දේසි

- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතට අනුකූලව කටයුතු කිරීම.
- ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති වලට අනුකූලව කටයුතු කිරීම.
- පළාත් පාලන දෙපාර්තමේන්තුව හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාන්ශය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ.
- මාර්ග සංවර්ධන අධිකාරී පනත.
- නාගරික සංවර්ධන අධිකාරී පනත.

04. අදාල කාර්යය හා කර්තව්‍ය සඳහා සම්බන්ධ වන පාර්ශවකරුවන්

- ප්‍රාදේශීය සභාව
- මාර්ග සංවර්ධන අධිකාරිය
- නාගරික සංවර්ධන අධිකාරිය
- බල ප්‍රාදේශයේ අවිධිමත් ව්‍යාපාර/ කාන්ත මූලික ව්‍යාපාර/ විශේෂිත අවශ්‍යතා සහිත පුද්ගලයින් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර හා සමෘද්ධිලාභීන් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර වලට අදාල පාර්ශව

05. ප්‍රතිපත්තිය

5.1 <u>අවිධිමත් ව්‍යාපාර</u>

I. බල ප්‍රදේශයේ මාර්ග රක්ෂිතයෙහි අවිධිමත්ව රැදි සිටින ව්‍යාපාරිකයින්ගට සංචාරක වෙළඳාම සඳහා බලපත්‍රයක් හා හැදුණුම්පතක් විධිමත්ව නිකුත් කිරීම.

II. මාර්ග රක්ෂිතයෙහි රැදි සිටින අවිධිමත් ව්‍යාපාරිකයින් ප්‍රාදේශිය සභාව සතු භූමිවල කඩ කාමර ඉදිකිරීමෙන් පසුව විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ බදු පදනම මත ස්ථානගත කර ව්‍යාපාරය විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

5.2 <u>කාන්ත මූලික ව්‍යාපාර/ විශේෂිත අවශ්‍යතා සහිත පුද්ගලයින් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර සහ සමෘද්ධිලාභීන් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර</u>

I. කාන්තා මූලික ව්‍යාපාර හා සමෘද්ධීලාභීන් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු පවත්වාගෙන යාම සඳහා නොමිලේ අවස්ථාව සලසා දීම.

II. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා ස්වයං රැකියා පුහුණු වැඩ සටහන් පවත්වා ඔවුන්ගේ ව්‍යාපාර වැඩිදියුණු කර ගැනීමට අවස්ථාව සලසා දීම.

III. සභාව සතු සතිපොළ භූමියන්හි ඉඩප්‍රස්ථාව ලබා දීමේදී බල ප්‍රදේශයේ සිටින මෙම සියලු කණ්ඩායම් වල ව්‍යාපාරික අවශ්‍යතා පුළුල් කරගැනීම සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දීම.

IV. බල ප්‍රදේශයේ සිටින මෙම සියලු කණ්ඩායම් වල නිෂ්පාදන අයකිරීමකින් තොරව සභා කාර්ය මණ්ඩලය සඳහා අලෙවි කිරීමට අවස්ථාවන් ලබා දීම.

අභ්‍යන්තර ප්‍රතිපත්ති අංක 05

<u>පොළහුම් සහ වෙළඳපල අවකාශ ලබාදීමේ ප්‍රමුඛතාවයන් සලකාබැලීමේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය</u>

01. හැඳින්වීම

කුරුණෑගල ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගන යනු ලබන වැල්ලව හා මාස්පොත සති පොළවල් දෙක සහ වැල්ලව, මාස්පොත හා මල්පිටිය පොදු වෙළඳපොළ තුළ ව්‍යාපාරික අවශ්‍යතා සඳහා ඉඩප්‍රස්ථා ලබා දීමේදී ආර්ථික හැකියාවන් අඩු, කායික දුබලතා හා විශේෂ අවශ්‍යතාවන්ගෙන් හෙබි පුද්ගලයින් මෙන්ම අවධානමට ලක්ව සිටින පාර්ශවද සලකා බලා ඔවුන්ගේ ගෘහ ඒකකයේ ආර්ථික තත්ත්වය නගා සිටුවීමටත් සමාජ තත්ත්වය ප්‍රශස්ථ මට්ටමකට ගැනීමත් මෙහි අරමුණ වේ.

02. පොළහුම් සහ වෙළඳපල අවකාශ ලබාදීමේ ප්‍රමුඛතාවයන් සම්බන්ධ නීතිමය විධිවිධාන

2.1 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122, 126 (XII) වන වගන්තිය</u>

පොදු වෙළඳපොළවල් හා සති පොළවල් පාලනයට හා නියාමනයට අතුරු ව්‍යවස්ථා සැකසීමේ බලය.

2.2 සභාවේ වාර්ෂික/ දීර්ඝ කාලීන බදු දීමේ කොන්දේසි.

2.3 සභාවේ වාර්ෂික බදු පැනවීමේ ගැසට් නිවේදන.

03. පිළිපැදිය යුතු සීමා හා කොන්දේසි

- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතට අනුකූලව කටයුතු කිරීම.
- ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති වලට අනුකූලව කටයුතු කිරීම.
- බදු ගිවිසුම් කොන්දේසි හා බදු පැනවීමේ ගැසට් නිවේදන.

04. අදාල කාර්යය හා කර්තව්‍ය සඳහා සම්බන්ධ වන පාර්ශවකරුවන්

- ප්‍රාදේශීය සභාව
- සතිපොළ/ පොදු වෙළඳපොළ ව්‍යාපාරික ප්‍රජාව
- කාන්තා වෙලෙන්දියන්
- විශේෂ අවශ්‍යතා සහිත වෙලෙන්දන්
- ප්‍රාදේශීය ව්‍යවසායකයින්
- අනෙකුත් අවධානමට ලක්වූ වෙලෙන්දන්

05. ප්‍රතිපත්තිය

I. සාමාන්‍යයෙන් කාන්තා වෙලෙන්දියන් හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් හට දෛනිකව එකතු කරන ලබන පොළ ගාස්තු ප්‍රමාණයෙන් සහනදායි ක්‍රමවේදයක් යටතේ වෙන්කර දීමට කටයුතු කිරීම.

II. පොළ භූමියේ ඉදිරිපස කොටස හැකි සෑම විටම කාන්තා පාර්ශවය වෙත වෙන්කරදීම.

III. පොළ භූමි තුල ඉහත සඳහන් පාර්ශවකරුවන් සඳහා ප්‍රවේශ මාර්ග හා වැසිකිලි පහසුකම් ඇතිකර තිබීම හා ඒවා නොමිලේ පරිහරනයට අවස්ථාව සලසා දී තිබීම.

IV. ප්‍රාදේශිය ව්‍යවසාකයන් දිරි ගැන්වීම සඳහා පුහුණු අවස්ථා සලසා දීම හා ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා නොමිලේ අවකාශ සලසාදී තිබීම.

V. පොළ භූමි තුල ඔවුන්ගේ නිශ්පාදන හදුන්වාදීම සඳහා අවස්ථාව සලසා දී තිබීම.

VI. අනෙකුත් අවධානමට ලක්වූ වෙලෙන්දන් සඳහා ඔවුන්ගේ තොරතුරු ග්‍රාම සේවා නිලධාරි මගින් තහවුරු කරගෙන ඔවුන්ටද ඉහත සඳහන් සියළු පහසුකම් සැපයීම

අභ්‍යන්තර ප්‍රතිපත්ති අංක **06**

<u>ආර්ථික වශයෙන් වරප්‍රසාද නොලත් කණ්ඩායම් සඳහා ආදාහනාගාර/සුසානභූමි/ මිහිදන්භූමි වෙන් කිරීමට හා ගාස්තු අය කිරීමට අදාල අභ්‍යන්තර ප්‍රතිපත්තිය</u>

01. හැඳින්වීම

කුරුණෑගල ප්‍රාදේශීය සභාව සතුව මාස්පොත හා දියබාව යන ආදාහනාගාර දෙකකින් ද ග්‍රාමසේවා වසම් මට්ටමින් ස්ථාපිත සුසාන භූමි හා මිහිදන් භූමි 73 කින් ද සමන්විත වන අතර සුසාන භූමි හා මිහිදන් භූමි වල ආදාහන කටයුතු හා භූමදාන කටයුතු ගාස්තු අය කිරීමකින් තොරව සපයනු ලබන අතර සභාව සතු ආදාහනාගාර දෙකෙහි ආදාහන කටයුතු සඳහා ගාස්තු අයකිරීමක් දැනට සිදු කරනු ලබයි.

මෙම අභ්‍යන්තර ප්‍රතිපත්තිය මගින් ඉහත ආදාහනාගාර සේවාවන් ලබා දීමේදී ආර්ථික වශයෙන් වරප්‍රසාද නොලත් කණ්ඩායම් සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග පිළිබිඹු කරයි.

02. ආර්ථික වශයෙන් වරප්‍රසාද නොලත් කණ්ඩායම් සඳහා ආදාහනාගාර/ සුසානභූමි/ මිහිදන්භූමි වෙන් කිරීම හා ගාස්තු අය කිරීම සම්බන්ධ නීතිමය විධිවිධාන

2.1 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 127 වන වගන්තිය</u>

සුසාන භූමි සහ මිනීපිටි ආඥාපනතේ 3 වන වගන්තියේ කාර්යය සඳහා සෑම ප්‍රාදේශීය සභාවක්ම ඒ ඒ ප්‍රාදේශීය සභාවේ සීමා ඇතුලත එම ආඥාපනත යටතේ නිසි බලධාරියා විය යුතු වීම.

2.2 සම්මත අතුරු ව්‍යවස්ථා

2.3 වාර්ෂික බදු පැනවීමේ ගැසට් නිවේදන

2.4 කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2016 -06-13 දින පවත්වන්නට යෙදුන මහ සභාවේ තීරණ අංක 1473 යටතේ සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීම.

03. පිළිපැදිය යුතු සීමා හා කොන්දේසි

- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතට අනුකූලව කටයුතු කිරීම.
- ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති වලට අනුකූලව කටයුතු කිරීම.
- බදු පැනවීමේ ගැසට් නිවේදන.
- ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශයේ ජීවත් වන ජනතාවගේ මෘත දේහ මිහිදන් කිරීම හා ආදාහනය කිරීම.
- මියගිය පුද්ගලයාගේ මරණ සහතිකය/මියගිය පුද්ගලයාගේ අනන්‍යතාවය/ ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත/ මියගිය පුද්ගලයාගේ බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයාගේ නිර්දේශය ආදී ලේඛන.

04. අදාල කාර්යය හා කර්තව්‍ය සඳහා සම්බන්ධ වන පාර්ශවකරුවන්

- මියගිය පුද්ගලයාගේ භාරකරුවන්
- තොරතුරු වාර්තා ලබා ගැනීමට පළාත් පාලන ආයතනයේ විෂය භාර නිලධාරින්.
- තොරතුරු වාර්තා ලබා දීමට සම්බන්ධ පළාතේ ග්‍රාම නිලධාරී, අත්‍යවශ්‍ය වුවහොත් ප්‍රාදේශීය ලේකම්.
- නිර්දේශ ඉදිරිපත් කිරීමට, නියෝග ලබා දීමට අදාල පළාත් පාලන ආයතනයේ ප්‍රධානියා.
- මහ සභාව හෝ කළමනාකරණ කමිටුව.

05. ප්‍රතිපත්තිය

I. බල ප්‍රදේශය තුල පවත්නා ආගමික සිද්ධස්ථාන වල පූජ්‍ය පක්ෂය ආදාහනය කිරීම සඳහා මුදල් අය නොකිරීම.

II. බල ප්‍රදේශය තුල වැඩිහිටි නිවාසවල සිටින පුද්ගලයින්ගේ මෘත ශරීර ආදාහනය කිරීම සඳහා ආදාහනාගාරය ලබා දීමට මුදල් අය නොකිරීම.

III. කෝවිඩ් වසංගත තත්ත්වය හමුවේ මිය ගිය අයගේ මෘත දේහයන් දුගී බව සනාථ කිරීමෙන් පසු ආදාහනය කිරීම සඳහා මුදල් අය නොකිරීම.

IV. ආදාහනාගාර නඩත්තුව හා අළුත්වැඩියා කටයුතු සඳහා බල ප්‍රදේශයේ ප්‍රජාව සමග එක්ව කටයුතු කිරීම.

V. භූමි අලංකරණය සඳහා මෘත දේහ රැගෙන එන්නන්ගේ ස්ව කැමැත්තෙන් මල් පෝච්චි හා අලංකාර පැලෑටි ලබා ගැනීම හා ඒවා සිටුවා ආදාහනාගාර පරිශ්‍රය අලංකාර කිරීම හා නිසි පරිදි නඩත්තු කටයුතු සිදු කර ගැනීම.

VI. සුසාන භූමි වල මෘත දේහ මිහිදන් කිරීමේ දී කිසිදු මුදලක් අය නොකිරීම.

VII. සුසාන භූමි භාරකාරීත්වය මරණාධාර සමිති වලට පැවරීම.

VIII. මිහිදන් කටයුතු පරිසර හිතකාමීව හා සෞඛ්‍ය ආරක්ෂිතව පවත්වාගන යන බවට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා ලවා වසරකට වරක් අධීක්ෂණ කටයුතු සිදු කිරීම.

IX. මිහිදන් කටයුතු සඳහාම වෙන් වූ ඉඩම් කොටස වෙනත් කටයුතු සඳහා භාවිතා නොකිරීමට වගබලා ගැනීම හා එසේ නොවන සෑම අවස්ථාවකදීම ඒ පිළිබඳව නීතිමය පියවර ගැනීම.

X. ඇතැම් කොටස් විශේෂ භූමිදාන සඳහා වෙන් කල යුතු යැයි අදහස් කරන්නේ නම් ඒ අනුව කටයුතු කිරීම හා එම කොටස් වෙන් කර තැබීම.

අභ්‍යන්තර ප්‍රතිපත්ති අංක **07**

<u>ක්ෂුද්‍ර කර්මාන්ත හා අවිධීමත් කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ නියාමනයට අදාල අභ්‍යන්තර ප්‍රතිපත්තිය</u>

01. හැඳින්වීම

කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කින් සහ ග්‍රාම නිලධාරී වසම් 120 කින් සමන්විත අතර මෙම කලාපය තුල මහා පරිමාන, මධ්‍ය පරිමාන හා කුඩා කර්මාන්ත යන කර්මාන්ත තුල පවත්වාගෙන යනු බලන අවිධීමත් කර්මාන්ත මෙන්ම ක්ෂුද්‍ර කර්මාන්ත රාශියක් ද පවත්වාගන යනු ලබයි.

මෙම කර්මාන්ත නියාමනය කිරීම සඳහා සභාව සතුව ශිල්පීය ඥානය සහිත නිලධරයන්ගේ හිගකම මත නියමිත කාලය තුල අදාල කර්මාන්ත නියාමනය කිරීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇත. මේ තුලින් සමාජීය හා පාරිසරික ගැටළු රාශියක් පැන නැගී ඇති අතර එම තත්ත්වය මග හරවා ගැනීම පිණිස මහජන සෞඛ්‍ය පරීක්ෂණ නිලධාරීන්ගේ සහ වයඹ පළාත් පරිසර අධිකාරියේ සහයෝගය සහ තාක්ෂණික දැනුම ලබා ගැනීම මෙම ප්‍රතිපත්තිය මගින් බලාපොරොත්තු වේ.

02. ක්ෂුද්‍ර කර්මාන්ත හා අවිධීමත් කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ සම්බන්ධ නීතිමය විධිවිධාන

2.1 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය</u>

පවත්වාගන යනු ලබන කර්මාන්ත සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම හා කර්මාන්ත නියාමනය කිරීම.

2.2 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 106(1)(2) වන වගන්තිය</u>

කර්මාන්තශාලා වලින් සිදු වන පරිසර දූෂණය නියාමනය.

2.3 සම්මත අතුරු ව්‍යවස්ථා
2.4 1990 අංක 12 දරණ පරිසර ප්‍රඥප්තිය
2.5 පීඩා ආඥාපනත

03. පිළිපැදිය යුතු සීමා හා කොන්දේසි

- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතට අනුකූලව කටයුතු කිරීම.
- 1990 අංක 12 දරණ පරිසර ප්‍රඥප්තිය

04. අදාල කාර්යය හා කර්තව්‍ය සඳහා සම්බන්ධ වන පාර්ශවකරුවන්

- ප්‍රාදේශීය සභාව
- ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය
- වයඹ පළාත් පරිසර අධිකාරිය
- ක්ෂුද්‍ර කර්මාන්ත හා අවිධීමත් කර්මාන්ත පවත්වාගන යන කර්මාන්තකරුවන්

05. ප්‍රතිපත්තිය

5.1 <u>ක්ෂුද්‍ර කර්මාන්ත</u>

- වයඹ පළාත් පරිසර අධිකාරියේ පරිසර ප්‍රඥප්තියෙන් ආවරනය නොවන මෙම කර්මාන්ත ප්‍රාදේශීය සභා පනතේ නියමයන්, සම්මත අතුරු ව්‍යවස්ථා සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් මගින් නියාමනය කොට වාර්ශික වෙළඳ බලපත්‍රයක් ලබා දී නියාමනය කිරීම.

5.2 <u>අවිධිමත් කර්මාන්ත</u>

- මෙම කර්මාන්ත වයඹ පළාත් පරිසර අධිකාරිය මගින් ප්‍රකාශයට පත් කොට ඇති පරිසර ප්‍රඥප්තියේ සඳහන් නීති හා රෙගුලාසි අනුව ප්‍රාදේශීය සභාවේ නියාමනයට යටත් කර්මාන්ත හා ව්‍යාපාර සම්බන්ධයෙන් පනවා ඇති කොන්දේසි වලට යටත්ව වාර්ශික වෙළඳ බලපත්‍රයක් ලබා දී නියාමනය කිරීම.

අභ්‍යන්තර ප්‍රතිපත්ති අංක 08

<u>අවිධිමත් ජනාවාස නියාමනය කිරීම සඳහා අභ්‍යන්තර ප්‍රතිපත්තිය</u>

01. හැඳින්වීම

කුරුණෑගල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ නාගරීකරණය කේන්ද්‍රකොටගත් ස්ථානයන් අධිකවීම මත ආර්ථික අපහසුතා ඇති අවිධිමත් පදිංචිකරුවන් සහ අවතැන් වූවන්ගේ ඝිග්‍ර වර්ධනයක් පෙන්නුම් කරනු ලබන අතර මේ තුලින් අවිධිමත් ජනාවාස ඇතිවීමත් එහි බලපෑම මත සමාජීය හා පාරිසරික ගැටළුකාරී තත්ත්වයන් පැන නැගීමත් සිදුවී ඇත.

මෙම තත්ත්වය අවම කිරීම සඳහා මෙම කණ්ඩායම නියාමනය කර ඔවුන්ට සුදුසු පාරිසරික හා සමාජීය තත්ත්වයක් ඇති කිරීම මෙම ප්‍රතිපත්තිය මගින් බලාපොරොත්තු වේ.

02. අවිධිමත් ජනාවාස නියාමනය කිරීම සම්බන්ධ නීතිමය විධිවිධාන

2.1 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19(XXIII) වන වගන්තිය</u>

දුගී ජනයාට සහනාධාර සැලසීම සඳහාත්, අසරණ තැනැත්තන් සහ කායිකව, මානසිකව හෝ සමාජීය වශයෙන් ආබාධිත තැනැත්තන් පුනුරුත්ථාපනය කිරීම සඳහාත්, ප්‍රාදේශීය සභා අරමුදලින් යම් කොටසක් වියදම් කිරීම.

2.2 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 98 වන වගන්තිය</u>

නිවාස තුල ජනාකීර්ණ බව තුරන් කිරීම.

03. පිළිපැදිය යුතු සීමා හා කොන්දේසි

- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතට අනුකූලව කටයුතු කිරීම.
- අයවැය මඟින් වෙන් කර ඇති ප්‍රතිපාදන
- වෙන්කල හැකි සභාව සතු ඉඩම්වල භිගකම

04. අදාල කාර්යය හා කර්තව්‍ය සඳහා සම්බන්ධ වන පාර්ශවකරුවන්

- ප්‍රාදේශීය සභාව
- ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය
- මාර්ග සංවර්ධන අධිකාරිය
- නාගරික සංවර්ධන අධිකාරිය
- අවිධිමත් පදිංචිකරුවන්

05.ප්‍රතිපත්තිය

1. අවිධිමත් ජනාවාස ලෙස හට ගන්නා පිරිස් ඒකරාශී කිරීම සඳහා කුරුණෑගල ප්‍රාදේශිය සභාව මගින් බල ප්‍රදේශය තුල කෝපිකන්දවත්ත නමින් ගම්මානයක් වෙන්කර තිබීම.
2. මෙම ජනවාසය වෙනුවෙන් අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේදී ප්‍රමුඛතාවයක් ලබාදී කටයුතු කිරීම.
3. මොවුන් සඳහා නිවාස ඉදිකර ගැනීම සඳහා සහා සීමාවන්ට යටත්ව නිවාසාධාර ලබාදීමට කටයුතු කිරීම.
4. පාසැල් යන වයසේ දරුවන් සඳහා අධ්‍යාපන උපකරන හා පොත්පත් ලබාදීමේදී තෝරාගන්නා කණ්ඩායමක් සඳහා අධාර උපකාර කිරීම.

අභ්‍යන්තර ප්‍රතිපත්ති අංක 09

<u>අවිධිමත් ව්‍යාපාර නියාමනයට අදාල අභ්‍යන්තර ප්‍රතිපත්තිය</u>

01. හැදින්වීම

කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කින් සහ ග්‍රාම නිලධාරී වසම් 120 කින් සමන්විත අතර මෙම කලාපය තුල මහා පරිමාන, මධ්‍ය පරිමාන හා කුඩා පරිමාන කර්මාන්ත සහ ව්‍යාපාර විශාල සංඛ්‍යාවක් පවත්වාගන යනු ලබන අතර ස්ථීර භූමියක් හෝ ඉදිකරීමක් සිදුකිරීමට වත්කමක් නොමැති විශාල පිරිසක් බල ප්‍රදේශයේ රක්ෂිත භූමි, පොදු ස්ථාන සහ ප්‍රධාන මාර්ග වල පදික මංතීරු භාවිතාකොට තම ජීවන මාර්ගය ලෙස නොයෙකුත් ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබයි.

මොවුන්ගේ පවුල් වල ජීවන තත්ත්වය මෙම අවිධිමත් ව්‍යාපාර කටයුතු මත රදාපවතිනු ලබන බැවින් මෙම ව්‍යාපාර විධිමත්ව නියාමනය කර පවත්වාගනයාම තුලින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම මෙම ප්‍රතිපත්තිය මගින් බලාපොරොත්තු වේ.

02. අවිධිමත් ව්‍යාපාර නියාමනය කිරීම සම්බන්ධ නීතිමය විධිවිධාන

2.1 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19(XXIII) වන වගන්තිය</u>

දුගී ජනයාට සහනාධාර සැලසීම සඳහාත්, අසරණ තැනැත්තන් සහ කායිකව, මානසිකව හෝ සමාජීය වශයෙන් ආබාධිත තැනැත්තන් පුනුරුත්ථාපනය කිරීම සඳහාත්, ප්‍රාදේශීය සභා අරමුදලින් යම් කොටසක් වියදම් කිරීම.

2.2 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126(X) වන වගන්තිය</u>

සංචාරක වෙළඳාම පාලනය හා විධිමත් කිරීමට අතුරු ව්‍යවස්ථා සැපයීමේ බලය

2.3 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149,150,151,152 වන වගන්තිය</u>

බල ප්‍රදේශයේ පවත්වාගන යනු ලබන ව්‍යාපාර විධිමත් කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අය කිරීම.

2.4 <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 94,95 වන වගන්තිය</u>

බල ප්‍රදේශයේ පොදු ස්ථාන, වීථි වල කසළ සහ මළ කළමණාකරණය.

2.5 සම්මත අතුරු ව්‍යවස්ථා

2.6 1990 අංක 12 දරණ පරිසර ප්‍රඥප්තිය

03. පිළිපැදිය යුතු සීමා හා කොන්දේසි

- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතට අනුකූලව කටයුතු කිරීම.
- 1990 අංක 12 දරණ පරිසර ප්‍රඥප්තිය

04. අදාල කාර්යය හා කර්තව්‍ය සඳහා සම්බන්ධ වන පාර්ශවකරුවන්

- ප්‍රාදේශීය සභාව
- ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය
- මාර්ග සංවර්ධන අධිකාරිය
- නාගරික සංවර්ධන අධිකාරිය
- අවිධිමත් ව්‍යාපාරික ප්‍රජාව

05. ප්‍රතිපත්තිය

I. වෙළදාම් කරනු ලබන ස්ථානය අනුව අදාල භූමිය හිමි ආයතනයේ අනුමැතිය ලබා ගැනීම සඳහා නිශ්චිත කාලයක් ලබා දීම.

II. එසේ අනුමැතිය ලබා ගන්නා ලද ව්‍යාපාරිකයන් සඳහා ව්‍යාපාරික කටයුතු සිදු කිරීමට එකඟතාවය ලබා දීම.

III. එසේ අනුමැතිය ලබා නොගන්නා ලද ව්‍යාපාරිකයන් සඳහා ප්‍රාදේශීය සභාව සතු භූමියක් ලබා දීමට හැකි නම් ඒ සඳහා ප්‍රමුඛතාවය ලබා දීම.

IV. ප්‍රාදේශීය සභාව සතු භූමියක් ලබා දීමට නොහැකි නම් සුදුසු ව්‍යාපාරික භූමියක් වෙත අනුගත වීමට ඔවුන්ව දැනුවත් කර නිශ්චිත කාලයක් ලබා දීම.

V. නිශ්චිත කාලයක්දී ඒ සඳහා අනුගත නොවූ ව්‍යාපාරිකයින් සඳහා ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන අනුව කටයුතු කිරීම.

අභ්‍යන්තර ප්‍රතිපත්ති අංක 10

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය

01. හැඳින්වීම

ලිංගිකත්වය පදනම් කරගෙන සමාජය විසින් කාලාන්තරයක් තිස්සේ විධිමත්ව නිර්මාණය කරදෙනු ලැබූ සමාජ සබඳතාවය ස්ත්‍රී පුරුෂ සමාජභාවය ලෙස සරලව හඳුන්වා දිය හැකිය. ස්ත්‍රී පුරුෂ ජීව විද්‍යාත්මක වෙනස මත සමාජය මෙම දෙපක්ෂය දකින ආකාරය ද වෙනස්ය. ඒ අනුව සමාජය විසින් මෙම බෙදීම නිර්මාණය කර තිබේ. එයට හේතුව ලොකයේ සෑම ප්‍රදේශයකම කාන්තාවන් සහ ගැහැණු ළමයින් වෙනස්කොට සැලකීම් වලට සහ ප්‍රවන්ඩත්වයට ගොදුරු වෙමින් පැවතීමයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූලික මානව අයිතිවාසිකමක් පමණක් නොව සාමකාමී, සමෘද්ධිමත් හා තිරසාර ලෝකයක් සඳහා අත්‍යවශ්‍ය පදනමක් වශයෙන්ද හඳුන්වා දිය හැකිය.

කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, යෝග්‍ය රැකියා හා දේශපාලන හා ආර්ථික තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සඳහා නියෝජනය ලබා දීම මගින් තිරසර ආර්ථිකයන්ට ශක්තියක් වන අතර සමාජ වලට සහ මානව වර්ගයාට විශාල වශයෙන් ප්‍රතිලාභ ලබාදෙනු ඇත. පළාත් පාලන ආයතනයක් වශයෙන් කුරුණෑගල ප්‍රාදේශීය සභාවේද කාන්තා සමානාත්මතාවය පිළිබඳ නව නීතිමය රාමු සකස් කර ක්‍රියාත්මක කිරීම සහ කාන්තාවන් ඉලක්ක කරගත් හානිකර භාවිතයන් තුරන් කිරීමට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් අවසන් කිරීමට මෙම ස්ත්‍රී පුරුෂභාවය සම්බන්ධ ප්‍රතිපත්තිය ඉවහල් වනු ඇත.

02. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ නීතිමය විධිවිධාන

2.1 02.01. 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත

ශ්‍රී ලංකාව තුල තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හා උපාය මාර්ගයන් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහාද, තිරසර සංවර්ධන සභාවක් පිහිටුවීම සඳහාද, ඊට සම්බන්ධ හා ආනුශංගික කරුණු සඳහාද විධිවිධාන සැලැස්වීම පිණිස සකස් කරන ලද නීතියකි.

2.2 02.02. 2017 අංක 16 දරණ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත

මෙම සංශෝධන පනතේ 27 (ඊ) 1 යටතේ එක් එක් පළාත් පාලන ආතනයේ සම්පූර්ණ සභිකයන්ගෙන් 25% කට නොඅඩු ප්‍රමාණයක් කාන්තා සභිකයන්ගෙන් සමන්විත විය යුතුය යනුවෙන් සඳහන්ව ඇති අතර එකී පනතේ 28 (2) අනුව පළමු නාමයෝජනා පත්‍රයෙහි තෝරා පත්කරගනු ලබන සභික සංඛ්‍යාවෙන් 10% කට නොඅඩු සංඛ්‍යාවක් සහ දෙවන නාමයෝජනා පත්‍රයේ තෝරා යැවිය යුතු අපේක්ෂක සංඛ්‍යාවෙන් 50% කට නොඅඩු සංඛ්‍යාවක් කාන්තා අපේක්ෂිකාවන්ගෙන් සමන්විය යුතු බව සඳහන් කර ඇත.

2.3 02.03. 2019.04.08 දිනැති අංක 2/2019 දරන අයවැය චක්‍රලේඛය

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් අයවැය කරණයට අදාල දත්ත හා තොරතුරු රැස් කිරීම හා සෑම අමාත්‍යාංශයකම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ කේන්ද්‍රිය ඒකක පිහිටුවීමට මෙම චක්‍රලේඛය මගින් උපදෙස් ලබා දී ඇත.

2.4 02.04. 1980.02.05 දිනැති අංක 158/1980 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

ජාතික වූත් ජාත්‍යන්තර වූත් උපදේශක හා පරිපාලන මණ්ඩල වලට ප්‍රමාණවත් ලෙස කාන්තාවන් නියෝජනය කෙරෙන පරිදි පත්වීම් කිරීමට ඇති අවශ්‍යතාවය ගැන සැලකිලිමත් වීමට මෙමගින් උපදෙස් ලබා දී ඇත.

2.5 02.05.1999.07.20 දිනැති අංක 18/99 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

රාජ්‍ය සේවයේ කාර්යය මණ්ඩල සඳහා බඳවාගන්නා හෝ උසස් කිරීම කරනු ලබන අවස්ථාවලදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩල වලට අවම වශයෙන් එක් කාන්තා සාමාජිකාවක්වත් හැකි සෑම අවස්ථාවකදීම පත්කල යුතු බවට මෙමගින් උපදෙස් ලබා දී ඇත.

2.6 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වන වගන්ති

කාරක සභා පත්කිරීම සහ එයට නියෝජිතයින් පත් කිරීම.

03. පිළිපැදිය යුතු සීමා හා කොන්දේසි

- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතට අනුකූලව කටයුතු කිරීම.

04. අදාල කාර්යය හා කර්තව්‍ය සඳහා සම්බන්ධ වන පාර්ශවකරුවන්

- ප්‍රාදේශීය සභාව
- ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය
- බල ප්‍රදේශයේ ප්‍රජාව

05. ප්‍රතිපත්තිය

I. මහසභාව නියෝජනය කිරීම සඳහා 25% කාන්තා නියෝජනය සඳහා අවස්ථාව සලසාදී තිබීම.

II. කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ කමිටු සහ උපදේශක කාරක සභා සඳහා කාන්ත නියෝජනය 25% අත්‍යාවශය කර තිබීම.

III. කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ දුක් ගැනවිලි හා පැමිණිලි මෙහෙයුම් කමිටු සඳහා කාන්තා නියෝජනය අනිවාර්ය කර තිබීම.

IV. අයවැය සකස්කිරිමේදී කාන්තා අභිවෘද්ධි වැඩ සටහන් සඳහා සැලැකිය යුතු ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කිරීම.

V. සායන මධ්‍යස්ථාන සඳහා මවිකිරි ලබාදීම සඳහා වෙනම ස්ථානයක් වෙන්කර දී තිබීම.

VI. අයවැය සඳහා යෝජනා ලබා ගැනිමේදී කාන්තා සංවිධාන වලින් යෝජනා ලබා ගැනීම විශේෂිත කොට සැලකීම.

VII. පුස්තකාල උපදේශක කමිටු සඳහා කාන්තා නියේජනය ලබාදීම.

VIII. සංවර්ධන කටයුතු සම්බන්ධ ප්‍රසම්පාදනයේදී කාන්තා සමිති සඳහා ප්‍රමුඛතාවය ලබාදීම.

IX. අන්තර් පළාත් පාලන ක්‍රීඩා තරග සඳහා (වෙලිබෝල්/ක්‍රිකට් සඳහා) කාන්තා නියෝජන අනිවාර්ය කිරීම.

X. අඩු ආදායම්ලාභී කාන්තාවන් නගා සිටුවීම සඳහා පුහුණු වැඩ සටහන් දියත් කිරීම.

XI. ගැබිනි කාන්තාවන් සඳහා පෝෂණ මලු ලබාදීමට කටයුතු කිරීම.

XII. ස්වයං රැකියාවල යෙදෙන වෙළඳාම් කරන බල ප්‍රදේශයේ කාන්තාවන් සඳහා ගාස්තු අය කිරීමකින් තොරව පොළ භූමියතුල අවස්ථාව ලබාදීමට කටයුතු කිරීම.

XIII. කාන්තා මූලික පවුල් සඳහා වැසිකිලි ආධාර ලබාදීමේදී ප්‍රමුඛත්වය ලබා දී කටයුතු කිරීම.

අභ්‍යන්තර ප්‍රතිපත්ති අංක **11**

ජල හා සනීපාරක්ෂාව පිලිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය

01. හැදින්වීම

පළාත් පාලන ආයතනයන් විසින් තම ආයතනයට අයත් බල ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාවගේ සුඛවිහරණය, පහසුව සහ සුබසාධනය සඳහා සපයනු ලබන සේවා වෙනුවෙන් තම ආයතනය විසින් ජනතාවට අවශ්‍ය පානීය ජලය හා සනීපාරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ පැවරී ඇති බලතල ප්‍රකාරව සහ වයඹ පළාතේ ජල හා සනීපාරක්ෂක ප්‍රතිපත්තිය ප්‍රකාරව කටයුතු කල යුතු අතර කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාව තුල ජීවත් වන ජනතාවගේ ජල හා සනීපාරක්ෂක කටයුතු ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒම මෙම ප්‍රතිපත්තිය මගින් බලාපොරොත්තු වේ.

02. ජල හා සනීපාරක්ෂාව සම්බන්ධ නීතිමය විධිවිධාන

2.1 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් 78 වගන්තිය
ප්‍රාදේශීය සභාව පොදු මහජන සෞඛ්‍ය පිළිබඳව අධිකාරිය විය යුතු බව.

2.2 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් 81 වගන්තිය
ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වර්ෂ ජලය හා අපවහන ජලය කළමණාකරණය කිරීම.

2.3 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් 85,86,87,88,89,90,91,92 වගන්ති
ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැසිකිළි සම්බන්ධ පාලනය.

2.4 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් 93,94,95 වගන්තිය
මලාපවහනය හා කසළ සෝදනය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා කාර්ය භාරය.

2.5 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් 96 වගන්තිය
සෞඛ්‍යට අහිතකර ගොඩනැගිලි සම්බන්ධව ප්‍රාදේශීය සභා කාර්ය භාරය.

2.6 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් 101(1)(2)(3) වගන්තිය
පෞද්ගලික දේපලවල තිබෙන සෞඛ්‍යාරක්ෂක භාධක ඉවත් කිරීම.

2.7 වයඹ පළාතේ ජල හා සනීපාරක්ෂක ප්‍රතිපත්තිය

03. පිළිපැදිය යුතු සීමා හා කොන්දේසි

- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතට අනුකූලව කටයුතු කිරීම.
- වයඹ පළාතේ ජල හා සනීපාරක්ෂක ප්‍රතිපත්තිය.

04. අදාල කාර්යය හා කර්තව්‍ය සඳහා සම්බන්ධ වන පාර්ශවකරුවන්

- ප්‍රාදේශීය සභාව
- ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය
- ප්‍රජාමූල සංවිධාන
- ජල සම්පාදන මණ්ඩලය
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- රාජ්‍ය නොවන සංවිධාන
- මාර්ග සංවර්ධන අධිකාරිය
- බල ප්‍රදේශයේ ප්‍රජාව

05. ප්‍රතිපත්තිය

I. ප්‍රජා ජල සමිති සමග සම්බන්ධතාවයක් නොමැති අයෙකුගෙන් ජල සම්බන්ධතාවයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් ලැබුණ හොත් ජල සමිතිය සමග සාකච්ඡා කර ඔවුන්ගේ නීතිරීති වලට යටත්ව ජලය ලබාදීමට අවශ්‍ය මූලික පියවර ගෙන තිබීම.

II. ජල සමිතිය හා ජල පාරිභෝගිකයා අතර ගිවිසුම්ගතවීමට අදාල ගිවිසුම සකස් කර දීම හා ඒ සඳහා දෙපාර්ශවය යොමු කරවීම.

III. පාඩු ලබන ජල සමිති පිලිබඳ සොයාබලා පාඩු නොවන ආකාරයෙන් පවත්වාගෙන යාම සඳහා උපදෙස් ලබාදීම.

IV. ජල සමිතිවල වාර්ෂික සංවත්සර සහා සඳහා සහභාගීවීම් හා ජල සමිති වල කටයුතු විනිවිදභාවයෙන් යුතුව කටයුතු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම.

V. ජල සමිතිවල මාසික හා වාර්ෂික ගිණුම් වාර්තා ගෙන්වා ගැනීම හා නිරන්තර අධීක්ෂණය හා උපදෙස් ලබාදීම.

VI. බල ප්‍රදේශයේ පොදු ස්ථාන සඳහා නොමිලේ ජල සැපැයුම ලබාදීමට කටයුතු කිරීම.

VII. කුරුණෑගල විසල් ජල ව්‍යාපෘතිය සමග ගිවිසුම්ගතවී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවට ජල සැපැයුම ලබා ගැනීම සඳහා නිරවුල් සහතිකය නොමිලේ නිකුත් කිරීම.

VIII. ජලනල ලබාගැනීම සඳහා බල ප්‍රදේශයේ මාර්ග පළුදු කිරීම සඳහා ලිඛිත ඉල්ලීමකට අනුව අවසර ලබාදීම හා අදාල ආයතන සඳහා ලිපි නිකුත් කිරීම.

IX. බල ප්‍රදේශයේ අනවසර නල ළිං ඉදිකිරීම පිලිබඳ සොයා බලා ඒවා විධිමත් කිරීම සඳහා කටයුතු කිරීම.

X. ඉල්ලීම් වලට අනුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සහයෝගයෙන් කාලීනව ජල සාම්පල් පරීක්ෂාව නොමිලයේ සිදු කර දීම.

XI. බලප්‍රදේශයේ පානීය ජල අවශ්‍යතාවය සඳහා ජලය හිඟ ප්‍රදේශවලට ජල බවුසරය මගින් නොමිලේ ජලය බෙදා හැරීම.

XII. ගංවතුර අවස්ථාවලදී බල ප්‍රදේශයේ අපවිත්‍ර වූ පානීය ළිං නොමිලේ පිරිසිදු කර දීම.

XIII. පොදු ස්ථාන හා ජලය හිඟ ප්‍රදේශවල පානීය ජල අවශ්‍යතාවය සඳහා නල ළිං ඉදිකරදීම හා එම නලළිං කාලීනව සභාව විසින් වැය දරා අළුත් වැඩියා කරදීම.

XIV. ඉල්ලීම්වලට අනුව බල ප්‍රදේශයේ පොදු ළිං ඉදිකිරීම හා අළුත්වැඩියා කරදීම.

XV. බල ප්‍රදේශයේ නාන තොටුපලවල් ඉදිකිරීම හා නඩත්තු කටයුතු සිදු කිරීම.

XVI. බල ප්‍රදේශයේ කානු පද්ධතිය අළුත්වැඩියා කිරීම හා කාලීනව නඩත්තු කිරීම.

XVII. බල ප්‍රදේශයේ නිසි පරිදි ජලය බැසයාම සඳහා පැති කානු ඉදිකිරීම හා නඩත්තුව.

XVIII. බෝවන හා බෝ නොවන රෝග නිවාරණය සඳහා ප්‍රජාව දැණුවත් කිරීමේ වැඩ සටහන් දියත් කිරීම.

XIX. අඩු ආදායම්ලාභීන් සඳහා වැසිකිලි ආධාර ලබාදීම තුලින් ඔවුන්ගේ සනීපාරක්ෂාව ඉහල නැංවීමට කටයුතු කිරීම.

XX. පොදු ස්ථානවල අවස්ථාවෝචිත පරිදි රාජ්‍ය ආයතන හා ස්වෙච්ජා සංවිධාන සම්බන්ධ කරගෙන ශ්‍රමදාන වැඩසටහන් පැවැත්වීම.

XXI. බල ප්‍රදේශයෙන් පැමිණෙන පෞද්ගලික වැසිකිලි ඉදිකිරීම සම්බන්ධ මහජන පැමිණිලි සඳහා මැදිහත්වීම හා ඒවා විසඳීමට කටයුතු කිරීම.

XXII. වැසිකිලි ඉදිකිරීමට පෙර මහජන සෞඛ්‍ය පරීක්ෂක සමග සම්බන්ධවී ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම.

XXIII. සායන මධ්‍යස්ථාන සඳහා නොමිලේ ජල සැපැයුම ලබාදීම හා හා මාසික ජල බිල්පත පියවීමට කටයුතු කිරීම.

අභ්‍යන්තර ප්‍රතිපත්ති අංක 12

<u>වැඩ, භාණ්ඩ හා සේවා සැපයීම සඳහා වූ අභ්‍යන්තර ප්‍රතිපත්තිය</u>

01. හැඳින්වීම

සභාවට අදාල වැඩ, භාණ්ඩ හා සේවා සපයා ගැනීම සඳහා බල ප්‍රදේශයේ ජනතාවගේ බදු මුදල් උපයෝගී කරගන්නා අතර එම බදු මුදල් බල ප්‍රදේශයේ දේශීය ව්‍යාපාර, කාන්තාවන් සතු ව්‍යාපාර සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සතු ව්‍යාපාර අතර බෙදා හැරීම තුලින් ඔවුන්ගේ ජීවන තත්ත්වයන් උසස් කිරීමත් මෙම ව්‍යාපාර නගා සිටුවීමත් මෙමගින් බලාපොරොත්තු වේ.

02. වැඩ, භාණ්ඩ හා සේවා සැපයීම සම්බන්ධ නීතිමය විධිවිධාන

2.1 ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ චක්‍රලේඛ අංක 09 දරණ ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහය.

2.2 1988 පළාත් පාලන මූල්‍ය හා පරිපාලන රීති.

03. පිළිපැදිය යුතු සීමා හා කොන්දේසි

- ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ චක්‍රලේඛ අංක 09 දරණ ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහය.
- 1988 පළාත් පාලන මූල්‍ය හා පරිපාලන රීති.

04. අදාල කාර්යය හා කර්තව්‍ය සඳහා සම්බන්ධ වන පාර්ශවකරුවන්

- ප්‍රාදේශීය සභාව
- විගණන නිලධාරීන්
- විමර්ශන නිලධාරීන්
- දේශීය ව්‍යාපාර, කාන්තාවන් සතු ව්‍යාපාර සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සතු ව්‍යාපාර සිදු කරනු ලබන පුද්ගලයින්

05. ප්‍රතිපත්තිය

I. කුරුණෑගල ප්‍රාදේශීය සභාව සඳහා වැඩ, භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීමේදී විවිධ ක්‍රම අතුරින් සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී දේශීය නිෂ්පාදන සහිත ව්‍යාපාර සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.

II. මිල ගණන් කැඳවීමේදී කාන්තාවන් සතු ව්‍යාපාරවලින් ලද මිල කැඳවුම් සම්බන්ධයෙන් අඩුම මිල නොවූවද, ගුණත්වයෙන් උසස් නිෂ්පාදන සඳහා මිල සෙසු ව්‍යාපාරවලට වඩා 5%-10% අතර ඉහල පරාසයක තිබුණද, එම මිල නිෂ්පාදන ගුණත්වය සමඟ සැසඳීමේදී සාධාරණ අගයක් ගනී නම් එවැනි කාන්තාවන් සතු ව්‍යාපාර සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.

III. මිල ගණන් කැඳවීමේදී විශේෂිත අවශ්‍යතා සහිත පුද්ගලයන් සතු ව්‍යාපාරවලින් ලද මිල කැඳවුම් සම්බන්ධයෙන් අඩු ම මිල නොවූවද, ඔවුන්ගේ එම මිල 5%-10% අතර ඉහල පරාසයක පැවතුනද, නිෂ්පාදන ගුණත්වය සමඟ සැසඳීමේදී සාධාරණ අගයක් ගනී නම් එවැනි පුද්ගලයින් සතු ව්‍යාපාර සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.

IV. ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී මිල කැඳවීම් වලදී දේශීය නිෂ්පාදන සහිත ව්‍යාපාර, කාන්තාවන් සතු ව්‍යාපාර, විශේෂිත අවශ්‍යතා සහිත පුද්ගලයින් සතු ව්‍යාපාර සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට අවස්ථා ප්‍රවර්ධනය කිරීම.